ස.සේ.කො. චක්‍රලේඛ අංක 07/2024

මගේ අංකය : ස.සේ.කො.06/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)
නව පළාත් සභා ගොඩනැගිල්ල,
දෙවන මහල, කුරුණෑගල.
2024.10.15

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

**පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14**
**රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ මැතිවරණ කාලසීමාව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ නිලධාරීන්,සේවකයින් බඳවා ගැනීම/උසස් කිරීම/මාරු කිරීම සීමා කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක: PE/2024/03 හා 2024.09.30 දිනැති චක්‍රලේඛයේ සඳහන් උපදෙස් හා බැඳේ.

02. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වන ගැසට් නිවේදනය 2024.09.24 දින නිකුත් කර ඇති බැවින් එම දින සිට මැතිවරණය පවත්වා අවසන් වන දින දක්වා වයඹ පළාතේ සියලුම සමුපකාර ආයතන සඳහා සේවකයින් බඳවා ගැනීම්/උසස් කිරීම්/ස්ථාන මාරු කිරීම් අත්හිටුවන ලෙසට මෙයින් දන්වමි.

වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

පිටපත්:

1. ප්‍රධාන ලේකම්(වයඹ) - කා.දැ.ස.
2. ලේකම්,සමුපකාර සංවර්ධන හා වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති,ක්‍රීඩා හා යෞවන කටයුතු,සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා.දැ.ස.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්(වයඹ) - කා.දැ.ස.
4. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, කුරුණෑගල/කුලියාපිටිය/හලාවත/මහව - කා.දැ.ස.